**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2014**

මගේ අංකය: විවැ/චක්‍රලේඛ/2014
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2014- 11 - 21

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම</u>**

විදේශගත විශ්‍රාම වැටුප් ලබන්නා වූ විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ මා විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ (16/2009 2010.04.06, 5/2011 2011.06.30, 5/2012 2012.12.20, 01/2014 2014.01.10) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.මෙම චක්‍රලේඛ www.pensions.gov.lk යන වෙබ් අඩවියෙන් ලබාගත හැක.

02. එම ලබා දී ඇති උපදෙස් අනුගමනය කිරීමෙන් තොරව විදේශගතව සිටින විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් මේ දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවනු ලබන බව අනාවරණය වී ඇත. එම උපදෙස් කෙරෙහි කාරුණික අවධානය යොමුකර වසරකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වී ඇති විශ්‍රාමිකයින්ගේ ඥාතීන්ව හා ග්‍රාම නිළධාරීන්ව දැනුවත් කර විශ්‍රාම වැටුප් ලිපිගොනු මෙම දෙපාර්තමේන්තුවේ විදේශ විශ්‍රාම වැටුප් අංශයට එවීමට කටයුතු කළ යුතුය.

03. තව ද මේ සමග එවනු ලබන අයදුම්පත විශ්‍රාම වැටුප් භාර නිළධාරීන් ලවා සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් ලිපි ගොනුව සමග විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන්න.

**විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳව විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් විමසීම් සඳහා**

| | | |
|---|---|---|
| * | සහකාර අධ්‍යක්ෂ - ආර්.එම්.ඒ.අයි.රත්නායක මයා | :- 011 - 2209870 , 011 - 2386469 |
| * | අංශ ප්‍රධානී - කේ.ආර්.එස්.එම්.බණ්ඩාර මිය | :- 011 - 2209871 |
| * | E mail | :- foreignpensions@gmail.com / foreign@pensions.gov.lk |
| * | Fax | : - 011 - 2386469 |
| * | Skype | :- fpensions |

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කොට සලකමු.

එස්.එස්.හෙට්ටිආරච්චි.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

පිටපත් : 1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් - විදේශ කටයුතු අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ ජනරාල් - විදේශ කටයුතු අමාත්‍යාංශය

# Transfer of Pension File To Foreign Branch

District

Divisional Secretariat

Pension Number

Pension Type

**Civil** **W&OP** **Forces**

Name in Full

Last Payment of Basic, CLA and other Allowances

| Year | Basic | CLA | Allowance |
|---|---|---|---|
| 01/11/09 | | | |

Last payment date

D D M M Y Y Y Y

Passport Number

Date of Birth

D D M M Y Y Y Y

Date of Departure

D D M M Y Y Y Y

Resident Country

Foreign Address

E mail Address

Skype Address

Telephone Number

Local Contact

Name

Phone Number